රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 192.

මගේ අංකය :- 76/1/19/8 (එම්සී)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## 1978 අගෝස්තු 10 දින දරණ ශ්‍රී ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

යථෝක්ත කාරණය සම්බන්ධයෙන් වූ අංක 124 හා 1978.09.07 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එම චක්‍රලේඛයෙහි 8, 9 හා 10 ඡේද අනුව නිලධාරීන් අදාල වැටුප් තලයන්හි පිහිටුවීමේදී, මෙම ඡේදවල විධිවිධාන වලට පටහැනිවන පරිදි සමහර නිලධාරීන් වැටුප් තලයන්හි පිහිටුවා ඇති බැව් පෙනී ගොස් තිබේ.

03. එහෙයින් අංක 124 හා 1978.09.07 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 8 ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

8. " මින් ඉදිරියට ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව යටතේ නිලධාරියකු වැටුප් තලයක /වැටුප් පරිමාණයක පිහිටුවීම රාජ්‍ය පරිපාලන ලේකම්වරයා විසින් කරනු ඇත. ඒ අනුව, අදාල වැටුප් තලයේ හෝ වැටුප් පරිමාණයෙහි පිහිටුවීම සඳහා, ශ්‍රී ලං.ප.සේ. යම් නිලධාරියෙකුගෙන් ලැබෙන ඉල්ලීමක් අමාත්‍යාංශ ලේකම්වරයා/දෙපාර්තමේන්තු ප්‍රධානියා පරීක්ෂා කොට;

(අ) එම ඉල්ලීමෙහි සඳහන් තොරතුරු නිවැරදි බවට සහ

(ආ) අදාල කාල සීමාව තුල නිලධාරියාගේ සේවය සතුටුදායකව පැවති බවට තමන් සෑහීමකට පත්වන්නේ නම්, තමන්ගේ සහතිකය සහ නිර්දේශයද සමග එම ඉල්ලුම් පත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. "

<u>සැ: යු:</u>

නියමිත කාලය තුල (උදා: ශ්‍රී ලං.ප.සේ. ව්‍යවස්ථා සංග්‍රහයෙහි 2(අ) (II) ඡේදය යටතේ නම් හය වසරක් තුළ) නිලධාරියා නියමිත දිනයන්හි වැටුප් වර්ධක උපයාගෙන ඇත්නම් සහ එම කාලය තුළ කර ඇති වරදක් සඳහා විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති නම්, ඔහුගේ/ඇගේ සේවය සතුටුදායක යයි නිගමනය කෙරේ.

/... 2/=

04. ඒ අනුව, 1978 අගෝස්තු මස 10 වැනි දින දරණ ශ්‍රී ලංකා පරිපාලන සේවා නව ව්‍යවස්ථා සංග්‍රහය නිකුත් වීමෙන් පසුව යම් යම් වැටුප් තලයන්හි/පරිමාණයන්හි පිහිටුවනු ලැබ ඇති සෑම ශ්‍රී ලං.ප.සේ. නිලධාරියකු සම්බන්ධයෙන් පහත සඳහන් ලියවිලි වහාම මෙම අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අංශය වෙත යැවිය යුතු වේ.

I. වැටුප් තලයෙහි පිහිටුවීම සඳහා කරන ලද ඉල්ලීමෙහි පිටපතක් හා,

II. එම ඉල්ලුම් පත සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දෙන ලද නියෝගයෙහි පිටපතක්.

( බී.අයි. ගුණතුංග )
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

1981 ජුනි මස 29 වැනි දින,
ඒකාබද්ධ සේවා අංශය,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
කොළඹ - 07.